**සංශෝධිත විෂය නිර්දේශය**

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව**

**CDCE 2021**

**නාට්‍ය හා රංග කලාව**

| **ස්තරය** | **සමාසිකය** | **පාඨමාලා කේතය** | **පාඨමාලා ඒකකයේ නම** | **අනිවාර්ය/ වෛකල්පිත** | **අධ්‍යයන සම්භාර** |
|---|---|---|---|---|---|
| ස්තරය 01 | I සහ II | DMAT 18214 | රංගකලාවේ මූලිකාංග (න්‍යාය සහ ප්‍රායෝගික 1) | අනිවාර්ය | 4 |
| | | DMAT 18224 | ශ්‍රී ලංකාවේ යාතුකර්ම සහ ගැමි නාට්‍ය | අනිවාර්ය | 4 |
| ස්තරය 02 | III සහ IV | DMAT 28214 | ග්‍රීක, රෝම සහ එලිසබතීන නාට්‍ය කලාව | අනිවාර්ය | 4 |
| | | DMAT 28224 | ආසියානු රංගකලා සම්ප්‍රදායන් | අනිවාර්ය | 4 |
| ස්තරය 03 | V සහ VI | DMAT 38214 | යුරෝපීය සහ ඇමරිකානු නාට්‍ය කලාව | අනිවාර්ය | 4 |
| | | DMAT 38224 | සමකාලීන ශ්‍රී ලාංකේය රංගකලාව (න්‍යාය සහ ප්‍රායෝගික 2) | අනිවාර්ය | 4 |

| | |
|---|---|
| පාඨමාලා කේතය | DMAT 18214 |
| වර්ගය | හර |
| මාතෘකාව | රංගකලාවේ මූලිකාංග (න්‍යාය සහ ප්‍රායෝගික 1) |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලා ඒකකය අවසානයේ ශිෂ්‍යයා,<br>01. කලා මාධ්‍යයක් ලෙස නාට්‍යයෙහි ස්වභාවය හඳුනා ගනියි.<br>02. නාට්‍ය හා රංගකලාවේ මූලික යෙදුම් සහ සංකල්ප නිර්වචනය කරයි.<br>03. නාට්‍ය පිළිබඳ පෙරදිග සහ අපරදිග නිර්වචන විග්‍රහ කරයි.<br>04. නාට්‍ය හා රංගකලාවේ ප්‍රභවය සහ මුල්කාලීන විකාශනය විස්තර කරයි.<br>05. රංගකලාවෙහි මූලිකාංග හඳුනා ගනියි.<br>06. නාට්‍ය හා රංගකලාවෙහි සීමා සහ ශක්‍යතා හඳුනා ගනියි.<br>07. ප්‍රධාන ප්‍රභේද අනුව නාට්‍ය වර්ගීකරණ කරයි.<br>08. නළුවා සහ රූපණය නිර්වචනය කරයි.<br>09. රූපණය පිළිබඳ ප්‍රධාන සිද්ධාන්ත සහ ශිල්පක්‍රම ගවේශණය කරයි.<br>10. ඒකල භාෂණ රචනා කිරීමේ හැකියා වර්ධනය කර ගනියි. |
| පාඨමාලා අන්තර්ගතය | 01. කලාව හැඳින්වීම.<br>කලාව යනු කුමක් ද? කලා වර්ගීකරණය, කලා මාධ්‍යයක් ලෙස නාට්‍යය.<br>02. පහත දැක්වෙන මූලික යෙදුම් පැහැදිලි කිරීම.<br>නෘත්ත, නෘත්‍ය, නාට්‍ය, රූපක, දෘශ්‍ය කාව්‍ය, Drama, Play, රංගකලාව, අනුකරණය, අභිරූපණය, සමාරෝපය, රූපණය.<br>03. නාට්‍ය ප්‍රභවය සහ මුල්කාලීන විකාශනය.<br>04. නාට්‍යය පිළිබඳ පෙරදිග හා අපරදිග නිර්වචන විග්‍රහ කිරීම.<br>ඇරිස්ටෝටල්, භරතමුනි, ධනංජය, ඇලඩයිස් නිකොල්, ක්ලෙයිටන් හැමිල්ටන්, හැට්ලෙන් තියඩෝර්, ජෝ ඊ. ඩයට්ට්‍රිච්, මාටින් එස්ලින්, බර්නාඩ් ෂෝ.<br>05. නාට්‍යයෙහි මූලිකාංග.<br>කතා වින්‍යාසය, චරිත, චින්තනය, භාෂාව හෝ වාග්විලාසය, ක්‍රියාව, ගැටුම, කාලය සහ අවකාශය, දෘෂ්ටි කෝණය, සංඥා, සංකේත, තානය. |

| | |
|---|---|
| | 06. නාට්‍ය බසෙහි සංරචක.<br>සංවාද, ඒකල භාෂණ, ආත්ම භාෂණ, ආංගික අභිනය, සාත්වික අභිනය, ගීත, කවි, වේදිකා පසුතල, වේෂභූෂණ, අංගරචනය, රංග භාණ්ඩ, චලන වින්‍යාසය (Blocking), ශබ්ද සංයෝජනය, නර්තන වින්‍යාසය, ප්‍රේක්ෂාව.<br>07. කලා මාධයක් ලෙස නාට්‍යයෙහි ලක්ෂණ.<br>සජීවීගුණය, සාමූහිකත්වය, නම්‍යශීලීබව, අනුපූරකත්වය (complementary) සංයුක්ත කලාවක් වීම, සංකීර්ණබව, ප්‍රබලබව, තත්වානුරූපී මායාව, ගතිකත්වය, ප්‍රේක්ෂක ප්‍රතිචාර මත වෙනස් වීම.<br>08. නාට්‍ය කලාවේ සීමා.<br>රචනය පිළිබඳ සීමා, රංගනය පිළිබඳ සීමා, ප්‍රයුංජනය පිළිබඳ සීමා.<br>09. නාට්‍ය කතන්දර කථන කලාවක් ලෙස.<br>කතන්දරය සහ කතා වින්‍යාසය. නාට්‍ය සහ සහිත්‍යය ප්‍රබන්ධ අතර ඇති වෙනස, නාට්‍ය සහ සිනමාව.<br>10. කාව්‍ය ශාස්ත්‍රයෙහි සහ නාට්‍ය ශාස්ත්‍රයෙහි දැක්වෙන මූලික නාට්‍ය සිද්ධාන්ත.<br>11. නාට්‍ය වර්ග සහ නාට්‍ය ප්‍රභේද.<br>12. නාට්‍ය සහ රංග කලාවෙහි කාර්ය සහ අරමුණු.<br>13. රූපණය පිළිබඳ මූලික සිද්ධාන්ත සහ ශිල්පක්‍රම.<br>රංග අභ්‍යාස සහ රංග ක්‍රීඩා, එසැණ නිරූපණ, හඬ පදම්කරණය.<br>14. ඒකල භාෂණ රචනය. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | 1. ඇරිස්ටෝටල් (1984) *කාව්‍ය ශාස්ත්‍රය* (පරි. ඒ. වී. සුරවීර) සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.<br>2. ගුණතිලක, එම්. එච්. (1999) *නාට්‍ය දෘෂ්ටි හා රත්නාවලි*, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ 10.<br>3. දිසානායක විමල්, කුමාරසිංහ කුලතිලක, (2011), නාට්‍ය කලාව පිළිබඳ හැඳින්වීමක්, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>4. පල්ලියගුරු, චන්ද්‍රසිරි (2002) *යථාර්ථය සහ නිර්මාණය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>5. මාරසිංහ, වෝල්ටර් (2004) *භරතමුනි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍රය,* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10. |

| | |
|---|---|
| | 6. සරච්චන්ද්‍ර, එදිරිවීර (1967), *නාට්‍ය ගවේෂණ, විමංස ප්‍රකාශන, කැලණිය.*<br>7. සරච්චන්ද්‍ර, එදිරිවීර (1992), *වෙස් මුහුණ ද සැබෑ මුහුණ ද?* ප්‍රදීප ප්‍රකාශයෝ, කොළඹ 12.<br>8. සුබසිංහ, අනුරාධ (2018), *නාට්‍ය හා රංග කලාවේ මූලිකාංග*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>9. පෙරේරා, ජේ. ඒ. ඩී. (2007), *වේදිකාවේ භූමිකාව,* රඟපෑම, රංග අභ්‍යාස සහ වේදිකාවේ භාවිතය උපදේශ සංග්‍රහය, ගණේමුල්ල, උදය ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිකේෂන්.<br>10. රණවක, ජයන්තා (1997), *අභිනය රංග කලාව,* පන්නිපිටිය, කර්තෘ ප්‍රකාශන.<br>11. Megaw, Carles (2000) *Acting is believing*. Cangage Learning.<br>12. Spolin, Viola, (2000) *Improvisation in the theatre*. Northwestern university press, Evanston Illinois. |

| | |
|---|---|
| පාඨමාලා කේතය | DMAT 18224 |
| වර්ගය | හර |
| මාතෘකාව | ශ්‍රී ලංකාවේ යාතුකර්ම සහ ගැමි නාට්‍ය |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලා ඒකකය අවසානයේ ශිෂ්‍යයා<br>01. අභිචාර සහ යාතුකර්ම නිර්වචනය කරයි.<br>02. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ශාන්තිකර්මවල අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ සහ අන්තර් රංග අවස්ථා හඳුනා ගනියි.<br>03. බෞද්ධ වත්පිළිවෙත්වල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ හඳුනා ගනියි.<br>04. යාතුකර්ම විෂයක රංගකලාව සහ ගැමි නාට්‍යයෙහි ප්‍රභවයට තුඩු දුන් ඓතිහාසික, සංස්කෘතික, ආගමික සහ සාමාජයීය සාධක හඳුනා ගනියි.<br>05. ගැමි නාට්‍යවල ස්වභාවය සහ විශේෂ ලක්ෂණ විස්තර කරයි. |
| පාඨමාලා අන්තර්ගතය | 01. අභිචාර සහ යාතුකර්ම පිළිබඳ නිර්වචන සහ වර්ගීකරණය.<br>අභිචාර පැවැත්වීමේ අරමුණු, අභිචාර හා සබැඳි විශ්වාස සහ වත්පිළිවෙත්, අභිචාරවල සහ ගැමි නාට්‍යවල මානව විද්‍යාත්මක පසුබිම, අභිචාර රංගයෙහි ඇති නාට්‍යමය ලක්ෂණ.<br>02. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ශාන්තිකර්මවල ඇති නාට්‍යමය ලක්ෂණ සහ අන්තර් රංග අවස්ථා.<br>කොහොඹා යක් කංකාරියෙහි යක්කම්, දහඅට සන්නිය හෙවත් සන්නියකුමෙහි සන්නි සහ පාලි. රටයකුමේ නානු මුරය, කපුයක්කාරිය සහ දරු නැළවිල්ල, ගම්මඩුවෙහි අඹ විදමන, මරා ඉපැද්දවීම සහ රාම මැරීම. සූනියම් යාගයේ වඩිගපටුන.<br>03. බෞද්ධ වත්පිළිවෙත්හි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ.<br>යුගාසන බණ, මිලින්ද ප්‍රශ්නය, ආලවක දමනය. දොරකඩ අස්න.<br>04. ගැමි නාටකවල ප්‍රභවය සහ විකාශනය.<br>05. ගැමි නාට්‍යවල ස්වභාවය සහ විශේෂ ලක්ෂණ.<br>සොකරි, කෝලම් සහ නාඩගම්. |

| | |
|---|---|
| | 06. සොකරි, කෝලම් සහ නාඩගම්වල ව්‍යුහය සහ රංග ශෛලිය.<br>පිටපත් සහ කථා, චරිත, අනුලක්ෂණ, රංග ශෛලිය.<br><br>07. ගැමි නාට්‍යවලින් නිරූපණය වන සමාජ ජීවිතය.<br>08. යාතුකර්ම විෂයක රංගකලාවෙහි සහ ගැමි නාට්‍යයෙහි මානව විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | 1. සරච්චන්ද්‍ර, එදිරිවීර (2004), *සිංහල ගැමි නාටකය,* එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>2. පල්ලියගුරු, චන්ද්‍රසිරි (1996), සිංහල බුදුසමයේ නාට්‍ය ලක්ෂණ, කර්තෘ ප්‍රකාශන, අභය මුද්‍රණ ශිල්පියෝ, කඩවත.<br>3. කෝට්ටගොඩ, ජයසේන (2003), *පහත රට ශාන්තිකර්ම සාහිත්‍යය,* ජේ.කේ. පබ්ලිකේෂන්, බොරලැස්ගමුව.<br>4. දිසානායක මුදියන්සේ, (2008,) ගැමි නාටක ප්‍රවේශය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>5. දිසානායක, මුදියන්සේ (1990), *උඩරට ශාන්තිකර්ම සහ ගැමි නාට්‍ය සම්ප්‍රදාය,* එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>6. ගුණතිලක, එම්. එච් (1968) කෝලම් නාටක සාහිත්‍යය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ 10.<br>7. දැළ බණ්ඩාර, ති.ර.ගා (2000), සිංහල කෝලම් සම්ප්‍රදාය, සම්භාව්‍ය ප්‍රකාශන, කැලණිය.<br>8. *කළුආරච්චි, ආරියරත්න (2006), කෝලම් නාටක විමසුම, ආර්.ජී. ග්‍රැෆික්, බොරලැස්ගමුව.* |

| | |
|---|---|
| පාඨමාලා කේතය | DMAT 28214 |
| වර්ගය | හර |
| මාතෘකාව | ග්‍රීක, රෝම සහ එලිසබතීන නාට්‍ය කලාව |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලා ඒකකය අවසානයේ ශිෂ්‍යයා,<br>01. ට්‍රැජඩි සහ කොමඩි නාට්‍යවල මූලික ලක්ෂණ හඳුනා ගනියි.<br>02. පැරණි ග්‍රීක රංගභූමිය, රෝම රංගභූමිය සහ ග්ලෝබ් රඟහල චිත්‍රණය කරයි. ඒවායේ කොටස් නම් කරයි. සංසන්දනය කරයි.<br>03. ඛේදජනක වීරයාගේ ලක්ෂණ හඳුනා ගනියි.<br>04. මධ්‍යකාලීන නාට්‍යවල විශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>05. ජන වන්දනා නාට්‍යවල ස්වභාවය සහ විශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>06. ග්‍රීක, රෝම සහ ශේක්ස්පියර්ගේ නාට්‍යවල ඇති සමාන සහ අසමානතා සංසන්දනය කරයි. |
| පාඨමාලා අන්තර්ගතය | 01. ග්‍රීක නාට්‍ය කලාවෙහි ප්‍රභවය සහ පරිණාමය.<br>02. ග්‍රීක රංගභූමියෙහි කොටස් සහ ඒවායේ කාර්යභාරය.<br>03. ට්‍රැජඩි නාට්‍යයක මූලිකාංග.<br>04. ප්‍රමාද දෝෂය (Hamartia), භාව විශෝධනය, (Catharsis) ත්‍රිවිධ ඒකත්වය (Three unities)<br>05. ට්‍රැජික් වීරයාගේ ලක්ෂණ.<br>06. ඊස්කිලස්, සොෆොක්ලීස්, යුරිපිඩීස් සහ ඔවුන්ගේ කෘති.<br>07. ඇරිස්ටොෆනීස් සහ මිනැන්ඩර් ගේ කෘති.<br>08. රෝම නාට්‍යකරුවන් සහ ඔවුන්ගේ කෘති.<br>09. මධ්‍යකාලීන සමාජ දේශපාලන සංදර්භය පිළිබඳ හැඳින්වීමක්.<br>10. අද්භූතජනක, ප්‍රාතිහාර්ය සහ සදුපදේශ (Mystery, Miracle, Morality) නාට්‍ය ප්‍රදර්ශනය කළ ආකාරය සහ ඒවායේ අන්තර්ගතය පිළිබඳ කෙටි හැඳින්වීමක්.<br>11. එලිසබතීන් යුගයේ නාට්‍යවල ප්‍රභවය සහ පරිණාමය.<br>12. ග්ලෝබ් රඟහලේ ආකාරය සහ එහි කොටස්.<br>13. විලියම් ශේක්ෂ්පියර් සහ ඔහුගේ නිර්මාණ අධ්‍යයනය. |

| | |
|---|---|
| | ගිම්හානයේ මැදියම් රයක සිහිනයක් සහ ඔතෙලෝ (Midsummer Night's Dream and Othello) |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | 1. ගම්ලත්, සුචරිත (2000) *බටහිර නාට්‍ය හා රංග කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ 10.<br>2. ජයවර්ධන, බන්දුල., පතිරාජ, විජේරත්න (1974) *සම්භාව්‍ය ග්‍රීක නාට්‍ය කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>3. ජයසේකර, කමනී (2004) *ග්‍රීක නාට්‍යකරු ඇරිස්ටොෆනීස්.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>4. ජයසේකර, කමනී (2000) *ප්ලෝටස්ගේ නාට්‍ය කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.<br>5. මාරසිහ, වෝල්ටර් (1995) *ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය.* කර්තෘ ප්‍රකාශන.<br>6. සුබසිංහ, අනුරාධ (2017) *සම්භාව්‍ය ග්‍රීක සහ සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ. |

| | |
|---|---|
| පාඨමාලා කේතය | DMAT 28224 |
| වර්ගය | හර |
| මාතෘකාව | ආසියානු රංගකලා සම්ප්‍රදායන් |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලා ඒකකය අවසානයේ ශිෂ්‍යයා<br>01. නාට්‍ය ශාස්ත්‍රයෙහි අන්තර්ගත මූලධර්ම විස්තර කරයි.<br>02. ආසියාවෙහි ප්‍රධාන රංගශාලා චිත්‍රණය කර ඒවායේ ප්‍රධාන කොටස් නම් කරයි.<br>03. ආසියානු රංග විධික්‍රම හඳුනා ගනියි.<br>ආසියානු සාම්ප්‍රදායික රංගකලා සංසන්දනය කරයි. |
| පාඨමාලා අන්තර්ගතය | 01. සංස්කෘත නාට්‍ය කලාව.<br>සංස්කෘත නාට්‍ය කලාවෙහි ප්‍රභවය සහ පරිණාමය, සංස්කෘත රංග ශාලාවන්හි අංග සහ ඒවායේ කාර්යය, සංස්කෘත නාට්‍යවල භාවිත වන මූල පද, භරතමුනිවරයා විසින් නාට්‍ය ශාස්ත්‍රය කෘතියෙහි හඳුන්වා දී ඇති මූලික නාට්‍ය සිද්ධාන්ත, ප්‍රමුඛ නාට්‍ය රචකයන් සහ ඔවුන්ගේ නිර්මාණ (මහා කවි කාලිදාස - අභිඥාන සාකුන්තලය සහ ශ්‍රී හර්ෂ දේව - රත්නාවලී )<br>02. සාම්ප්‍රදායික ජපන් නාට්‍ය කලාව.<br>නෝ නාට්‍ය : ප්‍රභවය සහ විකාශනය, නෝ වේදිකාවේ අංග සහ කාර්යය, ආකෘතිය, නෝ නාට්‍ය අන්තර්ගතය සහ රංග ශෛලිය, සෙ අමි මොතෙකියෝ සහ ඔහුගේ නිර්මාණ.<br>කබුකි නාට්‍ය : ප්‍රභවය සහ විකාශනය, කබුකි වේදිකාවේ අංග සහ කාර්යය, කබුකි ආකෘතිය, අන්තර්ගතය සහ රංග ශෛලිය,<br>03. පීකිං ඔපෙරා : ආකෘතිය, අන්තර්ගතය සහ රංග ශෛලිය. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |

| | |
|---|---|
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | 1. කාරියවසම්, තිස්ස (1999), *චීන නාට්‍ය හා රංග කලාව,* කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.<br>2. කුමාරසිංහ, කුලතිලක (1995) *නෝ කබුකි නාට්‍ය කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ, 10.<br>3. කුමාරසිංහ, කුලතිලක (2001) *ජපන් නාට්‍ය කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ, 10.<br>4. ගුණතිලක, එම්. එච් (1999) *නාට්‍ය දෘෂ්ටි හා රත්නාවලී.* සූරිය ප්‍රකාශකයෝ, කොළඹ 10.<br>5. තිලකසිරි, ජයදේව (1971) *සංස්කෘත නාට්‍ය සාහිත්‍යය.* සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ස් සමාගම, කොළඹ 2.<br>6. මාරසිංහ, වෝල්ටර් (1998) *සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය හා රත්නාවලී.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ, 10.<br>7. Kālidāsa – *Shakuntala* (play)<br>8. Śrīharṣa - *Ratnawali* (play). |

| | |
|---|---|
| පාඨමාලා කේතය | DMAT 38214 |
| වර්ගය | හර |
| මාතෘකාව | යුරෝපීය සහ ඇමරිකානු නාට්‍ය කලාව |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලා ඒකකය අවසානයේ ශිෂ්‍යයා,<br>01. නූතන යුරෝපයෙහි සමාජ දේශපාලනික වෙනස්වීම් හඳුනා ගනියි.<br>02. නූතන ඇමරිකාවෙහි සමාජ දේශපාලන සන්දර්භයෙහි විකාශනය සහ වෙනස්වීම හඳුනා ගනියි.<br>03. විවිධ නාට්‍ය ප්‍රභේද නිර්වචනය කරමින් ඒවායේ අර්ථ විවරණය කරයි.<br>04. සමකාලීන යුරෝපීය සහ ඇමරිකානු නාට්‍යකරුවන්ගේ නාට්‍ය රචනා ශෛලින්ගේ ඇති සමානතා සහ අසමානතා විස්තර කරයි. |
| පාඨමාලා අන්තර්ගතය | 01. නූතන යුරෝපයෙහි සමාජ, දේශපාලනික සහ දාර්ශනික සන්දර්භය.<br>02. නූතන යුරෝපීය නාට්‍ය කලාවෙහි ප්‍රභවය සහ විකාශනය.<br>03. ඇමරිකාවෙහි සමාජ දේශපාලන පසුබිම.<br>04. ඇමරිකානු නාට්‍ය කලාවෙහි ප්‍රභවය සහ විකාශනය.<br>05. විවිධ නාට්‍ය ප්‍රභේද : යුරෝපීය සහ ඇමරිකානු ප්‍රවේශ පිළිබඳ සංසන්දනය.<br>අරුමැසිවාදය (Romanticism.), යථාර්ථවාදය (Realism.), සංකේතවාදය (Symbolism.), ප්‍රකාශනවාදය (Expressionism.), වීර ආඛ්‍යාන රංගය (Epic), ඇබ්සර්ඩ් (Absurd.)<br>06. සමකාලීන යුරෝපීය සහ ඇමරිකානු ප්‍රමුඛ නාට්‍යකරුවන් සහ ඔවුන්ගේ නිර්මාණ.<br>හෙන්රික් ඉබ්සන් - සෙල්ලම් ගෙදර, අවතාර (Doll's House, Ghost), ඇන්ටන් චෙකොව් - චෙරි වත්ත (The Cherry Orchard), ඇල්බෙයා කැමූ - ක්‍රොස් පර්පස් (Cross Purpose), සැමුවෙල් බෙකට් - ගොඩෝ එනකං (Waiting for Godot), ඉයුජින් ඕ නීල් - එල්ම් තුරු යට සෙනෙහස (Desire under the Elm), තෝර්න්ටන් වයිල්ඩර් - හිරු දහස (Our Town), ආතර් මිලර් - අ විව් ෆ්‍රොම් ද බ්‍රිජ් (A view from the bridge) |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |

| | |
|---|---|
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | 1. A Doll's House - Henrik Ibsen.<br>2. Bently, Eric (1948) *the Modern Theatre*.<br>3. Bordman, Gerald, (ed.), (1984), *The Oxford Companion to the American Theatre*, New York, Oxford.<br>4. Caucasian Chalk Circle - Bertolt Brecht.<br>5. Cherry Orchard - Anton Chekov.<br>6. Downer, Alan S, (1967), *The American Theatre Today*, New York, Basic.<br>7. Esslin, Martin (1973), *The Theatre of the Absurd*, New York, Overlook Press.<br>8. Krutch, Joseph Wood, (1957), 2nd edn *The American Drama Since 1918*, New York, Random House.<br>9. Lumley, Frederick (1972) *New Trends in Twentieth Century Drama*.<br>10. Rhinoceros - Ionesco |

| | |
|---|---|
| පාඨමාලා කේතය | DMAT 38224 |
| වර්ගය | හර |
| මාතෘකාව | සමකාලීන ශ්‍රී ලාංකේය රංගකලාව (න්‍යාය සහ ප්‍රායෝගික 2) |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලා ඒකකය අවසානයේ ශිෂ්‍යයා,<br>01. නූර්ති සහ මිනර්වා නාට්‍යවල ලක්ෂණ විස්තර කරයි.<br>02. තෝරාගත් නාට්‍යකරුවන්ගේ නාට්‍ය රචනා ඇසුරින් නාට්‍ය පෙළ සම්බන්ධ ක්‍රමශිල්ප හඳුනා ගනියි.<br>03. ශ්‍රී ලාංකේය විවිධ නාට්‍යකරුවන් සහ ඔවුන්ගේ දාර්ශනික ප්‍රවේශයන් හඳුනා ගනියි.<br>04. නාට්‍ය ප්‍රයුංජනයට අවශ්‍ය රූපණ සහ අධ්‍යක්ෂණ කුසලතා වර්ධනය කර ගනියි.<br>05. රූපණය සහ අධ්‍යක්ෂණය විෂයෙහි සමකාලීන සහ නූතන නාට්‍ය තාක්ෂණික ක්‍රමශිල්ප සහ ආනුෂංගික සංරචක යොදා ගනියි. |
| පාඨමාලා අන්තර්ගතය | 01. නූර්ති, ටවර් හෝල් සහ මිනර්වා සම්ප්‍රදායන්.<br>02. විශ්වවිද්‍යාල නාට්‍ය සමිතිවල දායකත්වය.<br>03. නූතන ශ්‍රී ලාංකේය නාට්‍යකරුවෝ. |

| | |
|---|---|
| | එදිරිවීර සරච්චන්ද්‍ර, දයානන්ද ගුණවර්ධන, ගුණසේන ගලප්පත්ති, හෙන්රි ජයසේන, සුගතපාල ද සිල්වා සහ වෙනත් ප්‍රමුඛ නාට්‍යවේදීන්.<br>04. මෙම කාල පරාසයේදී ශ්‍රී ලාංකේය නාට්‍යකරුවන් විසින් කරනු ලැබූ විවිධ අත්හදාබැලීම් සහ පර්යේෂණාත්මක රංගකාර්යයන්.<br>05. රූපණ ක්‍රමශිල්ප සහ ක්‍රියා පටිපාටි.<br>06. පෙළ කියවීම සහ විශ්ලේෂණය.<br>07. සාම්ප්‍රදායික (පෙරදිග) සහ නූතන (යුරෝපීය) රංගකලාවට ආබද්ධ රූපණ ප්‍රකාර : යථාර්ථවාදී සහ ඇබ්සර්ඩ් රංගකලාව.<br>08. නළුවාගේ සහ අධ්‍යක්ෂකගේ භූමිකාව.<br>09. නාට්‍ය අධ්‍යක්ෂක : නිර්මාණකරුවකු, අර්ථකථනයකරන්නෙකු සහ කළමනාකරුවකු ලෙස.<br>10. නාට්‍ය පුහුණුවීම් ක්‍රියාවලිය සහ නිෂ්පාදන ක්‍රියාවලිය.<br>11. වේදිකා පසුතල, රංග භාණ්ඩ, රංග වස්ත්‍රාභරණ සහ අංගරචනා නිර්මාණකරණය.<br>12. රංගාලෝකය.<br>අභිප්‍රාය සහ අරමුණු, මෙවලම් සහ පාලනය, වර්ණ භාවිතය, සැළසුම්කරණය, ආලෝක ප්‍රයෝග (Effects) |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | 1. කාරියවසම්, තිස්ස (1981), *සිංහල නාට්‍යයේ විකාශනය (1867 - 1911),* කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ.<br>2. කාරියවසම්, තිස්ස (1982), *විශ්වවිද්‍යාලයීය නාට්‍ය වංශය 1921 - 1981,* කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.<br>3. දැල බණ්ඩාර, ගාමිණී සහ වෙනත් අය (සංස්.), අභිනය - කලාප 01 - 08 (1996 - 2000), බත්තරමුල්ල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.<br>4. පතිරාජ, විජේරත්න (2007), *සිංහල නාට්‍ය වංශය,* කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.<br>5. බෝගමුව, චන්ද්‍රසිරි (සංස්.) (2001), *සංඛ - රාජ්‍ය නාට්‍ය උත්සව විශේෂ කලාපය,* බත්තරමුල්ල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.<br>6. බෝගමුව, චන්ද්‍රසිරි (සංස්.) (2003), *අභිනය 09 - 70 දශකයේ නාට්‍යකරුවෝ,* බත්තරමුල්ල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. |

| | |
|---|---|
| | 7. බෝගමුව, චන්ද්‍රසිරි (සංස්.) (2009), *අභිනය 10 - 80 දශකයේ නාට්‍යකරුවෝ,* බත්තරමුල්ල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.<br>8. බෝගමුව, චන්ද්‍රසිරි (2007), *සමකාලීන සිංහල වේදිකාව,* මුදුන්ගොඩ, තරංග ප්‍රකාශකයෝ.<br>9. සරච්චන්ද්‍ර, එදිරිවීර (2004), *සිංහල ගැමි නාටකය,* කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.<br>10. ධර්මකීර්ති, රංජිත් (1997), *ස්ටැනිස්ලාව්ස්කි සහ ඔහුගේ රූපණ විධි ක්‍රමය,* නුගේගොඩ, කර්තෘ ප්‍රකාශන.<br>11. පද්මසිරි, ජගත් (2010), වේදිකා නාට්‍යයේ ආනුෂංගික අංග, තරංජී ප්‍රින්ටස්, මහරගම.<br>12. රස්නැක්, බෙන් (පරි) (2003), *ස්ටැනිස්ලව්ස්කිගේ අසිරිමත් රංගන කලාව,* දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශක.<br>13. රොඩ්‍රිගෝ, සෙනෙවිරත්න (2012), *වේදිකාවට ආලෝකය,* පන්නිපිටිය, ස්ටැම්ෆර්ඩ් ලේක් සමාගම.<br>14. රෝහණ, ජයලාල් (1997), *සබේ විදුලි විලක්කුව,* බොරලැස්ගමුව, සී. ආර්. සී. මුද්‍රණාලය.<br>15. සිල්වා, සුගතපාල ද (1998), *සොඳුරු ආශ්වාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක,* කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. |